ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය - I | කාලය පැය 01 යි |
|---|---|---|

- ❖ උපදෙස් ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ❖ මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ලැබේ.
- ❖ අංක 01සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1,2,3,4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න .
- ❖ මේ සඳහා බහුවරණ පිළිතුරු පත්‍රිකා භාවිතයට ගන්න.

---

❖ අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවලට එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

1. නිමල් කමල්ට පැවසුයේ **ආලවට්ටං** නැතුව කෙලින්ම පැවසිය යුතු බවයි.
   1. අනවශ්‍ය වර්ණනා නොමැතිව
   2. පවතින ලෙසම
   3. රසවත් ව
   4. ස්වභාවෝක්තියෙන් යුතුව

2. **විපුලගේ උත්සහය කුරුල්ලන්ට වැට බැඳීමක්** වැනි යැයි සොයුරා කල්පනා කළේය.
   1. කුරුල්ලන් ඇල්ලීමට යාම
   2. නිරර්ථක දෙයක් කිරීම.
   3. ආරක්ෂිත දෙයක් කිරීම.
   4. හොඳ උත්සාහයක් ගැනීම.

3. **හිටි පියෝරේ** ගමන් ඇරඹීම නුසුදුසු බව පැරණි ගම්මුන්ගේ මතයකි.
   1. උදේ පාන්දර ම
   2. මධ්‍යම රාත්‍රියේ
   3. මධ්‍යාහ්නයේ
   4. ඉර බහින වෙලාව

❖ **ප්‍රශ්න අංක 04 සිට 06 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

4. නිර්මාණයක සැබෑ රසය ................ රසිකයා ඉන් අතිශය සංවේදී බවට පත්වෙයි.
   1.උකහා ගන්නා  2. උසුලා ගන්නා  3. අපේක්ෂා කරන  4. අරමුණු කරන

5. පාලකයා හෝ පාලක පිරිස විසින් අනුගමනය කරනු ලබන විවිධ ..................... මත පාලිතයන්ගේ ජීවන ආකල්ප සකස් වෙයි.
   1. ආදර්ශ  2. ආකල්ප  3. හැකියාව  4. ප්‍රතිපත්ති

6. සාමාන්‍යයෙන් දරුවාගේ භාෂා ................. වර්ධනයට ඒ අවට පරිසරය සෘජුව ම බලපායි.
   1. චිරස්ථිතිය  2. ප්‍රබලත්වය  3. යෝග්‍යත්වය  4. ශක්‍යතාව

7. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1. ගුරුකුල, ගැලපීම, ගිමන්හල,චිත්තාමණි,
   2. ප්‍රත්‍යයාර්ථ, විමෝක්ෂ,විරෝධ, සාම්ප්‍රදායික
   3. වාර්ථාව, අධීක්ෂණය, භාෂණය, දේශනය
   4. වර්ධනය, වයිරසය, ස්පෘෂ්ය, මර්දනය

EXAMRESULTS.LK

8. උක්ත නාම පද පමණක් ඇති වරණය තෝරන්න.

1. කාන්තාවක, මිනිසෙකු, රියදුරෙකු, වෛද්‍යවරයෙක්
2. අයෙක්, ඇතැමෙක්, කෙනෙක්, සමහරු
3. ගුරුවරුන්, කපුටෝ , ග්‍රන්ථයන්, ළමයින්
4. විදුහල්පතිතුමා, දෙවිවරුන්, පියුම්හු, ඔවුන්

9. පහත දී ඇති පද පේළිවල ඇතුළත් පදවල දෙවන අක්ෂරයෙහි පිළිවෙළින් කෙටි ඇදය , ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල , දීර්ඝ පාපිල්ල යෙදී ඇති වරණය සොයන්න.

1. කරුව, අකාරුණික, සීදූව, සදූප
2. අවුව, මනුව, පේළිය, බූරුවා
3. ග්‍රැමෆෝන්, ගුණාංගය, ගිනියම, අභූත
4. මිහිරි, මාරුව, මරුවා, ස්තූපය

10. උපසර්ගයක් රහිත පදයක් සහිත වරණය තෝරන්න.

1. අත්‍යලංකාර, නිරාහාර, පිළිගනී, විමල
2. පරාජය, බුද්ධිමත්, ප්‍රමාණ, ආචාර
3. ප්‍රබල, කුපුරිස්, ප්‍රත්‍යුත්තර, සුගන්ධ
4. අනුනායක, අවගුණ, පබල, සුදන

11. අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.

1. ළඟ, ළදරු,ළතෝනි, ළඳ
2. විරල, විමාන, විරූඪ, විලායක,
3. පරිපාලන, පරණ පරිශීලන, පරිශ්‍රය
4. කණාමැදිරි, කනස්සල්ල, කනිෂ්ඨ, කරඬුව

12. අකුසල්, ගවුම්පොඩි යන පද දෙක අයත් වන්නේ

1. අන්‍යාර්ථ සමාස, හා දකාරාර්ථ සමාස
2. අන්‍යාර්ථ සමාස හා විශේෂණ සමාස
3. විභක්ති සමාස හා විශේෂණ සමාස
4. අව්‍ය සමාස හා විශේෂණ සමාස

13. ප්‍රත්‍යය + අර්ථ, නීති + අනුකූල, ප්‍රසංග +ඉක යන පදවල නිවැරදි ප්‍රකාශය වන්නේ

1. ප්‍රත්‍යයාර්ථ, නීත්‍යනුකූල, ප්‍රාසංගික
2. ප්‍රත්‍යාර්ථ, නීත්‍යානුකූල, ප්‍රාසාංගික
3. ප්‍රත්‍යයාර්ථ, නීත්‍යනුකූල, ප්‍රාසාංගික
4. ප්‍රත්‍යාර්ථ, නීත්‍යනුකූල, ප්‍රාසංගික

14. ‘‘ ලෝක + ඉක '' යන්න සෑදෙන්නේ,

1. ලෝකික
2. ලෝඉක
3. ලෞකික
4. ලෞකීක

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

1. විභක්ති - ගොවියා, පියවරුන්, රටින්, උගතුන්ට
2. සමාස - අනෞචිත, දසරජදම්, ජනප්‍රිය, අක්කනඟෝ
3. අව්‍ය පද - පබඳ, අපනයන, නොලසා, අධිචෝදනා
4. සන්ධි - නිරවුල්, අස්සන, සුරත, දුන්න

16. “ කියත උන් මේ තෙපෙළ ” යන වාක්‍යයේ “ කියත ” යන්නෙහි ක්‍රියා වර්ගය කුමක්ද ?

1. විධි ක්‍රියා 2. පූර්ව ක්‍රියා 3. මිශ්‍ර ක්‍රියා 4. අසම්භාව්‍ය ක්‍රියා

17. ‘‘ ව්‍යංග්‍යාර්ථවත් වචන ආකෘතිය, රිද්මය කවි ලිවීමෙන් ම ප්‍රගුණ කරග ගත යුතුය.''
ඉහත වාක්‍ය ඇතුළත් තද්ධිත පදයක් වන්නේ,

1. ආකෘතිය 2. ව්‍යංග්‍යාර්ථවත් 3. ප්‍රගුණ 4. රිද්මය

18. “ නඳ ” යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,

1. දන්තජ
2. කණ්ඨජ
3. තාලුජ
4. මූර්ධජ

❖ අංක 19 සිට 20 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

19. **<u>අභිප්‍රේතාර්ථය</u>** නෂ්ට වූ කල ප්‍රතිඵලය ඉතා ඉච්ඡාභංගත්ව යයි.

1. බලාපොරොත්තු වූ දෙය
2. සිත් තැවුල
3. ආතතිය
4. බලාපොරොත්තු නොවූ දෙය

20. මන්දපෝෂණය ළමුන්ගේ **<u>ස්මරණ</u>** ශක්තිය හීන කිරීමට බෙහෙවින් බලපාන බව වෛද්‍ය නිගමනයයි.

1. දැනුම
2. මරණ වැඩිවීම
3. මතකය
4. ශරීර ශක්තිය

21. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. පිළිමය - ප්‍රතිමාව, අනුරුව, ප්‍රතිමූර්තිය, පිළිරුව
2. ඇස - නයන, නුවන, නේත්‍රය, අක්ෂි
3. තරුණ - යොවුන්, තුරුණු, තිඹිරි, ගැටවර
4. මොනරා - මයුර, පිල්බර, නිල්ගෙල, සිකි

22. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

1 “ ෆ ” යන්න ‘‘උපද්මාතය '' නමින් හැඳින්වේ.
2. “ සමහරු ” යන්නෙහි අනුක්ත පදය “ සමහරුන් '' යන්නයි.
3. “ වැල්ලම්පිටිය ” යන පදය ද්විත්ව රූප සන්ධි වේ.
4. “ කළහ ” යන්න අතීත කාල, මධ්‍යම පුරුෂ බහු වචන ආඛ්‍යාත පදයකි.

23. ආගම සන්ධියට හා ස්වර සන්ධියට අයත් නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1. දෙවුර, ඇද්දළ
2. කටුවල , පසැස්
3. නිලුපුල්, අතිනත
4. ළිංපඩිය, දෑගසවි

24. යුගල පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

1. යන-එන, උදේ-සවස, එහා-මෙහා, අඹු-සැමි
2. එහෙන්-මෙහෙන්, කිචි-බිචි, නොකා-නොබී, ගත-සිත
3. ගුණ-අගුණ, ගුටි-බැට, නඩු-හබ, පඩි-නඩි
4. තාන්න-මාන්න, සම-බල, ගසා-බසා, හරක-බාන

25. මූර්ධජ පමණක් ඇතුළත් වරණය වන්නේ,

1. ඝ, ඪ, ළ, ඩ, ට
2. ප, ඍ, ශ, ස, හ
3. ප, ඵ, බ, භ, ම
4. ය, ඞ, ඵ, හ, ඣ

❖ අංක 26 සිට 27 තෙක් දී ඇති අදහසට වඩාත්ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. අතීසාරයට අඹුඩ ගැසීම.

1. ප්‍රතිකාරයක් කිරීම
2. ප්‍රතිකාරයක් නොකර සිටීම.
3. කළ යුතු දේ තිබියදී වෙනත් දෙයක් කිරීම.
4. කිසියම් දෙයක් නිවැරදි ආකාරයෙන් කිරීම.

27. කඩල ඇට උඩ පැන්නට කබල බිඳේ ද?

1. විශාල බලාපොරොත්තු නිශ්ඵල වීම.
2. කඩල ඇට බර අඩු බවයි.
3. පටන්ගත් දෙය අත හරින්නට බැරි වීම.
4. තමන්ගේ තරම දැනගෙන කල් හැරිය යුතු බවයි.

28. රූපකයක් සහිත වරණය තෝරන්න.

1. "මහ පොළොව තෙමේ මැ කුඹල් සකස් සේ පෙරළේ"
2. " සකි සඳ පෙනේ සමනොළ ගිර නැගෙනහිර "
3. " ගලන ගඟකි ජීවිතේ "
4. " මුතු වන් දසන් "

❖ අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. 1. අයෙක් ක්‍රීඩා කරයි.
2. මා ගමට යති'යි දෙමාපියෝ සිතති.
3. සතුන් උද්‍යානයේ ඇත.
4. එක් අයෙක් උද්‍යානයේ සිටිති.

30. 1. ශිෂ්‍යයන් කැටුව උපදේශකවරු දේශන ශාලාවට පැමිණෙති.
2. අපේ මිතුරෝ තරඟය ජය ගනීවි.
3. දෙමාපියෝ එයට සම්බන්ධ නැත.
4. නුඹ නොහොත් මා ගමට යන්නෙහි.

31. " රන් රෝස " ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

1. හෙන්රි ජයසේන මහතාය
2. ආරියවංශ රණවීර මහතාය
3. දයානන්ද ගුණවර්ධන මහතාය
4. ජයලත් මනෝරත්න මහතාය

32. A. මම වේලාසනින් ……………….. පාසල් ගියෙමි.
B. ඔහු උණෙන් ………………. කැස්සෙන් පෙළෙයි.
C. යුද හමුදාව සටන්…………….. නික්මිණ.
D. නංගි පියුමක්……………… මුව විහිදා සිනාසුනා ය.

E. බඳු F.ම G. හා H. පිණිස

- ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක්ද?

1. EHGF 2. FGHE 3. GHFE 4. HEFG

33. ධීවර ජන වහරේ 'මාරියාව' ලෙස හඳුන්වන්නේ,

1.කාලගුණය 2. මුහුදු රළ 3. වැස්ස 4. මාළු දැල

34. රත්න දීප ජන්මභූමි
ලංකා දීප විජයභූමි
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි.

- ඉහත සඳහන් වන්නේ ලංකාවේ සුප්‍රසිද්ධ ගීතයක කොටසකි. එම ගීතයේ පද රචකයා වන්නේ,

1.මහගමසේකර මහතා ය. 2. රත්න ශ්‍රී විජේසිංහයන් ය.
2.ඩබ්. ඒ. අබේසිංහ ය. 4. අරිසෙන් අහුබුදු ය.

35. පහත කවියේ හතරවන පදය තෝරන්න.

වඩිමින් සවස නල හැසිරෙන දිගතුවල
සොබමන් සුනිල් මිණි නිල් නුබ තුර විපුල
පතසන් අවර ගිරි නැටියෙන් වැටෙන කල
…………………………………………...

1. ලකල ගුවන් තල සිරි යහන නිකසල 2. විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඩල
3. අතුළ කුසුම් විලසින් සැදෙන තුරු වැල 4. උදුළ සොම් කැලුම් නිසයුරු හිමි පුවළ

36. '' රංබරණා, සභාපති, ගේතු "යන චරිත අන්තර්ගත වන නාට්‍ය කුමක් ද?

1. මනමේ 2. සිංහබාහු
3. තල මල පිපිලා 4. නරිබෑනා

37. පද බෙදා ලිවීම් අතින් වඩාත් නිවැරැදි වරණය තෝරන්න.

1. ''තා මේ වීරියට හළුයේ අප නිසා මුත් තෙල කුමාරයා නිසා නො වන්නේ වෙද?"
2. '' ඇතැ බැලු බැලූ වන් අනේ! අනේ! යි කිය වන ඇත් රජු"
3. '' අනඳ පහ වැයා. මා පෙර නොසිට "
4. '' ඌ කරා නොගොස් අප කරා වරැ "

38. මිනිස් කට හඬෙන් තොර - ඇත කඳු හෙල් අතර
මහ වනය අරක් ගත් - තිබේ එක් භූමියක්
මගේ හද බැමි සිඳ - මිණි කිරුළ බරණ ලා
නොබා යළි හිස ඔසවා ......

ඉහත සඳහන් පදයෙන් කියවෙන්නේ,

1. ඇදහිලි ගණන් නොගෙන බුද්ධියෙන් ජීවිතය ගැන සිතා බැලිය යුතු බවයි.
2. බුද්ධියට ඉඩ නොදී දෙවියන් කෙරෙහි භක්තිය ඇතිකර ගැනීම.
3. ඉසුරු සැප සම්පත් වනය තුළ ද ඇති බව.
4. වනගතව මහණදම් පිරීමේ දී මිනිස් කටහඬ නෑසෙන පෙදෙසකට යායුතු බවයි.

39. මුහුණේ ඉරියව් මගින් අදහස් ප්‍රකාශනය අයත්වන්නේ,

1. ආංගික අභිනය 2. වාචික අභිනය 3. සාත්වික අභිනය 4. ආහාර්ය අභිනය

40. පහත පහත සඳහන් පාඨයේ අර්ථය ට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

"රටක යටිතල පහසුකම්වල සංවර්ධනයක් සිදුවී තිබීම එරට සමෘද්ධිමත් භාවයේ එක් සංකේතයක් වශයෙන් සැලකිය හැකිය."

1. යටිතල පහසුකම් දියුණු කිරීමෙන් රටක් සංවර්ධනය කළ හැකිය.
2. රටක යටිතල පහසුකම් දියුණු වී තිබීම එරට සංවර්ධනයේ ලක්ෂණයකි.
3. රටක සංවර්ධනයේ ප්‍රධාන ලක්ෂණය වනුයේ යටිතල පහසුකම් දියුණු වී තිබීමයි.
4. රටක් සංවර්ධනය වන්නේ එරට යටිතල පහසුකම් තිබුණහොත් පමණි.

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය - II | කාලය පැය 02 යි |
|---|---|---|

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

1) ( i ) සිට ( x ) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. සිංහල අක්ෂර මාලාවේ එන කණ්ඨජ අක්ෂර 02ක් හා ඕෂ්ඨජ අක්ෂර 02 ක් ලියා දක්වන්න.

II. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියා දක්වන්න.

(අ) ප්‍රදාන (ආ) ප්‍රධාන

III. පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.

වැඩිහිටියන්ගේ උපදෙස් අනුව කටයුතු කිරීමෙන් තම අභිවෘද්ධිය ළඟා කරගත හැකි ය.

IV. පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

(අ) දිවි ඇතිතාක් (ආ) තම පරපුරෙන් ලැබෙන උරුමය

V. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

"ශ්‍රී ලංකාවේ ඖෂධ භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව වෛද්‍ය පර්යේෂණ ආයතනය නිකුත් කල වාර්තාවක සඳහන් වේ."

VI. පහත සඳහන් (අ)සහ (ආ)යෙදුම්වල පළමුවැනි වචනය සමඟ දෙවැනි වචනය නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය හෝ සකස් කර ලියන්න.

(අ) දන්තධාතු මැඳුර (ආ) කල්‍යාණ මිතුර

VII. පහත සඳහන් වාක්‍ය සදොස් වේ නම් ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ)පාසලේ ශිෂ්‍ය නායකයෝ නැවත රැස් වෙන්නේ කවදාද?
(ආ)සතුරෝ විසින් අප පීඩාවට පත් කරනු ලැබුවෙමු.

VIII. පහත දැක්වෙන පද විසන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.

(අ) අරුණෝදය (ආ) නිරවුල්

IX. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති. (ආ) ආදි ශිෂ්‍යයෝ අප පිළිගත්හ.

X. පහත සඳහන් හේන් ගොවිතැන හා සම්බන්ධ යෙදුම්වලට ගැළපෙන පොදු භාෂා ව්‍යවහාරයේ එන අදහස ලියන්න.

(අ) අක්වැස්ස (ආ) සකලයන්

(ලකුණු 2 X 10 = 20)

2) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාව ද යොදන්න.

(අ) කැළි කසළ අවිධිමත් ලෙස පරිසරයට බැහැර කිරීමට බොහෝ දෙනා පුරුදු වී සිටිති. එයින් සිදුවන පරිසර හානිය හා සෞඛ්‍ය ගැටලු අප්‍රමාණය. කසළ කළමනාකරණය සඳහා නිසි ක්‍රමවේදයක් නොතිබීම මේ ප්‍රශ්නය දුරදිග යාමට හේතුවී තිබේ. ලොව ඇතැම් රටවල් කැළි කසළ ප්‍රතිචක්‍රීකරණය මගින් මහත් ආර්ථික ප්‍රතිලාභ අත්කර ගනිමින් සිටින කාලයක කැළි කසළ සම්පතක් බවට පෙරළා ගැනීමට අපට හැකි විය යුතුය.

(ආ) ශ්‍රමාභිමානය රටකට අත්‍යවශ්‍ය අංගයකි. අද අධ්‍යාපනය ලබන බොහෝ දරුවන් තුළ නැත්තේ ද ශ්‍රමාභිමානයයි. තමා ම වවන ලද දෙයක් ආහාරයට ගැනීම කෙතරම් හොඳ දෙයක් ද? විවිධ රැකියා කරා නගරයට ඇදී එන ගම්බද තරුණ තරුණියන්ගේ කුඹුරු වතුපිටි පාළු වී තිබේ. නගරයේ සුළු රැකියාවකට වඩා ගොවිතැන සැලසුම් සහගතව කළේ නම් මීට වඩා ආදායමක් ලැබිය හැකිව තිබිණි. ඒ සඳහා සිතීමට කාලය එළැඹ තිබේ.

(ඉ) මෑතදී බෝනොවන රෝග ව්‍යාප්තිය මුළු ලෝකය පුරාම දක්නට ලැබේ. ඒ අතර 'covid 19' හෙවත් කොරෝනා රෝගය බෝවන රෝගයක් ලෙස පැතිරී යයි. මේ රෝගය වැළඳී මිය ගිය සංඛ්‍යාව අධික වේ. ලෝකයේ බලවත් රාජ්‍යයක් වන ඇමෙරිකාව, චීනය, බ්‍රිතාන්‍ය පමණක් නොව සෑම රටකට ම විශාල ලෙස මෙම රෝගයට ගොදුරු වීම දක්නට ලැබේ. රෝගයට ගොදුරු වීමේ දී මිනිසුන්ගේ නොසැලකිලිමත් බව හේතු වූ අතර රෝගය වළක්වා ගැනීමටත් වැළඳුණු අය බේරා ගැනීමටත් අපේ මේ පුංචි රට තුළ නොකළ දෙයක් නැත. ජාතියක් ලෙස නැගී සිටිමින් ත්‍රිවිධ හමුදාව රටේ පාලන තන්ත්‍රය සමඟ එකමුතු වීම දක්නට ලැබිණි. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වූ සියලු දෙනා සිහිපත් කළ යුතුවේ. මෙම රෝගය මර්දනය සඳහා ශ්‍රී ලංකාව ගෙන ගිය වැඩ පිළිවෙළ අපි අගයමු.

(ඊ) එදින වේලාසනින් නින්දට ගිය මා නිදි දෙව්දුව වැළඳ ගත්තේ ඉතා ඉක්මනිණි. සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වෙමින් සිටි නිසා පසුගිය දින කිහිපයම නිදි වර්ජිතව බොහෝ වේලා සිටීමට සිදුවිය. මම සිහින ලොවකට පිවිසියෙමි. මොහොතකින් මා සිටියේ පිට්ටනියක් වැනි ස්ථානයකය. රවුම් හැඩයෙන් යුත් යානාවක් එහි නවතා තිබෙන අයුරු දුටු මම එතැන වහා ඉවත්වීමට සූදානම් වීමි. නමුත් එයින් පිටතට ආ දෙදෙනෙක් වහා මා යානයට ඇද දමා ගත්හ. ඉන් අනතුරු දුටු දේ කුමක්දැයි පවා මට අදහා ගැනීමට නොහැකි විය.

(ලකුණු 25)

3) පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ යෙදූ වචන සංඛ්‍යාවද සාරාංශය අග ලියන්න.

අද සමාජයේ බොහෝ පුද්ගලයන් ජංගම දුරකථන මගින් සිදු කරනු ලබන්නේ ඇමතුම් ගැනීම, ඇමතුමකට පිළිතුරු දීම, කෙටි පණිවිඩ සේවාව ලබාගැනීම, ඡායාරූප ගැනීම ආදි වූ සීමිත කාර්ය සංඛ්‍යාවක් පමණි. එසේම සමහරුන් ජංගම දුරකථනය භාවිතා කරන්නේ විවේකී අවස්ථාවල යම් යම් පරිගණක ක්‍රීඩාවල නිරත වීම සඳහා ය. ඇතැම් අවස්ථාවල සමාජ ජාල වෙබ් අඩවිවල සැරිසැරීම සඳහා ද මෙය භාවිතා කරයි.

මෙවැනි නවීන තාක්ෂණික මෙවලම් භාවිතා කරන්නන් අතරින් සුළු පිරිසක් තමන්ගේ කාර්යබහුල ජීවිතය මෙයින් කළමනාකරණය කරමින් අධ්‍යාපනය කාර්යයන් සඳහා අවශ්‍ය දැනුම ලබා ගැනීමට, නව තොරතුරු, නව දැනුම හා නව අත්දැකීම් ගවේශනය කිරීමටත් මෙය යොදා ගනිති. එහෙත් විවිධ අපරාධ හා සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා මෙම උපකරණ යොදා ගැනීමට ඇතැම් පුද්ගලයන් පෙළඹී සිටීමෙන් සමාජ ප්‍රගමනයට බාධා ඇතිවීම ද කනගාටුවට කරුණකි. අහිතකර ප්‍රතිඵල සෘජුවම බලපාන පාර්ශවය වන්නේ අනාගත ලෝකය භාර ගැනීමට සූදානම් වන නව ලොවට පා ඔසවන ළමා හා යොවුන් පරපුරයි. ඒ අතරින් ද බහුතරය පාසල් සිසුන් වන අතර යම් යම් කරුණු අත්හදා බැලීමේ ප්‍රවණතාව හා කුතුහලය යන හේතු මත මෙම මෙවලම් අවභාවිතා කිරීමට යාම නිසා බොහෝ අයහපත් ප්‍රතිඵල දැකිය හැකිය.

(ලකුණු 10)

4) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විද්‍යාව මනුෂ්‍ය සංහතියට සාධාරණය වූ දායාදයක් වන අතර ජාතික දායාදය වශයෙන් සැලකිය යුත්තේ භාෂාව, සාහිත්‍ය හා ශිල්පයත්, ඒවා සමඟ අනිවාර්යෙන් අත්වැල් බැඳගෙන ඇති චාරිත්‍ර වාරිත්‍ර විද්‍යා විෂයෙහි නම් යල්පැනපු මතිමතාන්තර තිබේ. එහි නොඇලී අප ඉදිරියට ගියහොත් එය අපේ ගෞරවයට හේතු වන්නේ ය. ආහාර නිෂ්පාදනය, සෞඛ්‍ය, වාසස්ථාන, යානවාහන ආදිය සම්බන්ධයෙන් නවීන විද්‍යාවේ පිහිට සොයා අපේ ජනතාව සුඛිත මුදිත කිරීම එක්තරා විදියක ජාතිවාත්සල්‍යකි. එහෙත් ඒ අතර ම කිසියම් ජාතියක අනන්‍යතාවය ද රැක ගත යුතුය. ආරෝග්‍යශාලා හැම රටකට ම පොදුය. ජෙට් අහස් යාත්‍රා සෑම ජාතියකට ම අයිතිය. මොටෝරිය, ට්‍රැක්ටර්,විදුලි බලය වැනි වෙනත් දේ කාටත් තිබේ. එහෙත් කිසියම් ජාතියක අනන්‍යතාව රැකෙන්නේ ඒ ජාතියේ සංස්කෘතිය නිසා ය. මෙකල නියම ජාතික ලක්ෂණයක් කොට සැලකිය හැක්කේ කලා ශිල්ප ආදියයි.

I. මේ පාඨයේ මූලික අරමුණ කවරේ ද ?
II. ජාතික දායාදයක් වශයෙන් මෙහි දක්වා ඇත්තේ කුමක් ද ?
III. ජනතාවගේ සුඛිත මුදිතභාවය සඳහා දියුණු කළ යුතු අංශ ලෙස දක්වා ඇති කරුණු මොනවා ද ?
IV. ජාතියක අනන්‍යතාව හා සංස්කෘතිය අතර පවතින සම්බන්ධතාවය මේ ලේඛකයා දකින්නේ කෙසේ ද ?
V. පහත සඳහන් යෙදුම්වල අදහස් පැහැදිලි කරන්න.

(අ) අත්වැල් බැඳගෙන
(ආ) යල්පැනපු මතිමතාන්තර

(ලකුණු 2 X 5= 10)

5) නව නිර්මාණකරණයෙහි දක්ෂතා ඇති තරුණ තරුණියන්ට සිය නිර්මාණ හැකියා වැඩි දියුණු කර ගැනීමටත් ඒ මගින් රටේ ආර්ථිකයට දායාද කර ගැනීම සඳහාත් අරමුණු කර ආධාර ලබාදීමේ වැඩ පිළිවෙළක් කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කර ඇත. නව නිර්මාණයේ ස්වභාවය, අවශ්‍ය අමුද්‍රව්‍ය, ඉන් ලැබෙන ප්‍රයෝජන හා යන වියදම් ආදී කරුණු සහිතව අමාත්‍යාංශයට යැවීමට සුදුසු ලිපියක් ලියන්න.
(වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

නැතහොත්

සරසි පොත් ප්‍රකාශකයන් තම ප්‍රකාශන ආයතනයට වසර 50 සපිරීම නිමිති කරගෙන සාහිත්‍ය මාසය පුරා පොත් සල්පිලක් පැවැත්වීමට සැලසුම් කර ඇත. විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව ලියැවුණු පොත් 20% සිට 50% දක්වා වූ වට්ටම් සහිතව තම සේවාදායකයින්ට ලබාදීමට ඔවුහු බලාපොරොත්තු වෙති. මේ පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා සුදුසු අත්පත්‍රිකාවක් සකස් කරන්න.
(වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15)

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය - III | කාලය පැය 02 යි |
|---|---|---|

❖ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

❖ **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**

❖ මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.

---

1) ( i ) සිට ( x ) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. (අ) ජාතක කතා පොත සිංහලයට නැගීමට සහය දුන් රජතුමා කවුද ?
(ආ) ජාතක කතා පොතට පාදක කර ගත් මුල් කෘතිය නම් කරන්න.

II. "තත මතු ද සින්දේ - <u>පිළිමල් දුප</u> ද සින්දේ "
(අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න .
(ආ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

III. "දෙව්මිනිසුන් විසින් පුදන ලද බුදුරජ බොහෝ කලක් ගිය කලැ මට වැඩ සඳහා මේ මහා වලට වැඩියැ"
(අ)මේ පාඨය ඇතුළත් මුල් කෘතිය කුමක්ද ?
(ආ) මෙසේ සිතන්නේ කවුද ?

IV. "කැලෑ රොදට වදිද්දී වරක් දෙකක්ම පයට දැනුණු පිළිකුල් ස්පර්ශය මතක් වන විටත් හිරිකිතයක් ඇති කරලයි "
(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය ලිව්වෙ කවුද ?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කතාව ලියා ඇති දෘෂ්ටිකෝණය කුමක්ද ?

V. "මුන් වහන්සේ සිනාවක් සී පී සේක "
(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කතාව කවර මුල් කෘතියකින් උපුටා ගන්නා ලද්දක් ද ?
(ආ) මෙම ප්‍රකාශය කරන අය යමින් සිටියේ කවර කටයුත්තක් සඳහා ද?

VI. " මිහඹ මුව මඬල මෙන් දිලිසෙන හැම විට
දුලභ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
කිරඹ පොකුරු මී රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට"

(අ) මෙහි සඳහන් උපමාව සරල බසින් ලියන්න
(ආ) මෙහි "පොකුරු මී "යනු මොනවාද ?

VII. "ඔයාට තේරෙනවා ඇති නෙ. මොකවත් ම නැති අපිට මෙච්චර සල්ලියක් ගෙවන එක ලේසි වැඩක් වෙන්න බැරි විත්තිය"
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුද ?
(ආ) මෙම කොටස ඇතුළත් කෘතියේ රචකයා කුමන ජාතිකයෙක්ද?

VIII. "ඕවා ගිහින් කියනවා මට නෙවෙයි උසාවියට "
(අ) මෙම පාඨය උපුටාගත් කෘතිය ලියූ රචකයාගේ මුල්ම කෙටි කතා සංග්‍රහය කුමක්ද ?
(ආ) මෙසේ පවසන්නේ කවුද ?

IX. (අ) ලෝක නාථා දේවියට පුත් කුමරකු ලබා දෙන ලෙස දෙවියන්ගෙන් ඉල්ලමින් ලියන ලද කෘතිය කුමක්ද?
(ආ) සිරි පැරකුම් රජුට සෙත සලස්වන ලෙස දෙවියන්ගෙන් ඉල්ලමින් ලියන ලද කෘතිය කුමක්ද?

X. " ඔහුගේ කවි සංකල්පනා ශෛලිගේ නිර්මාණවලට සමීප බව විචාරක අදහසයි "
(අ) මෙසේ පවසන්නේ කවුරුන් ගැනද ?
(ආ) එහෙත් ඔහු සමීප වූයේ කාගේ නිර්මාණවලට ද ?

( ලකුණු 2 X 10 = 20)

2) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. "බැඳි දන මන වැයුමෙහි ඇඳුරෝයා
විදි සත්සර වෙන **සර** මදුරෝයා
රැඳී සතොසින් සැනහුණු ඉඳුරෝයා
**වැදි දන** සිරි ගත්තු ය කිඳුරෝයා"

(අ) මෙම කවියෙන් කියවෙන්නේ කවරෙක් ගැන ද ?
(ආ) වැදි දන , සර යන පදවල අදහස ලියන්න.

ii. ඈ කෝරලේ මහත්මයාගෙන් තාවකාලිකව ඉල්ලාගත් කරත්තයක තමා සතු බඩු මුට්ටු ටිකත් පටවාගෙන ළමා ළපටිනුත් කැටුව කොටගොඩ බලා පිටත් වූවාය.
(අ) මෙසේ කොටගොඩ බලා පිටත් වූයේ කවුද ?
(ආ) ඇට එහි යාමට සිදු වූයේ කවර හෙයින් ද?

iii. ආචාර්ය ඔවුන් තමා සනා ඇති වැ බණන සේ දැකැ' ඇය හා ඔහු සසඟ ඇති සේ යැ ' යි බිඳී ' ඔහු මරමි ' සිතී.
(අ) මෙම කොටස හා සම්බන්ධ අවස්ථාව ලියන්න .
(ආ) මෙම කොටසෙහි අදහස ලිහිල් බසින් ලියන්න .

iv. " සේ රිවි බිම්බා පතළ තෙද බලැති මහරු
මෙන **රන් ටැම්බා** නිසසල ගුණයෙන් සපිරු
මනරම් **යුග බා** දී අහස ඔසවන යුරු
නේ විකුම් සිහබා පෙරළුවේ ය ගල් පුවරු "

(අ) මේ ඉන්නිසයේ නාට්‍ය රචකයා සිංහබාහු ගැන සපයා ඇති විශ්ලේෂණ දෙකක් තෝරා ඉදිරිපත් කරන්න.
(ආ) ඉරි ඇඳි පදවල අර්ථ දක්වන්න.

v. " **දිමුත්** වෙහෙර වට විසිතුරු මල් වතුය
එහිත් සුවඳ මල් නිතිවෙයි **මිණිමුතුය**
මහත් තුරු මියුරු එල ගෙන නැමිඅතුය
රැගත් සෙවෙණ නොහැරම සිටි පොල් වතු ය"

(අ) විහාරය වටා සුන්දරත්වයෙන් ඔප් නැංවී ඇත.ඊට බලපා ඇති සාධක දෙකක් ලියන්න.
(ආ) දිමුත් සහ මිණිමුතු යන පදවල අදහස ලියන්න.

(ලකුණු 4 X 5 = 20)

3) උම්මග්ග ජාතකය සාර්ථක වීම කෙරෙහි ,
I. භාෂා රීතිය
II. මනා චරිත නිරූපණය හේතු වී ඇත.
උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න .
නැතහොත්
I. ජන ජීවිතයට අදාළව යහපත් උපදේශයන් ලබා දීමත් ,
II. ජන කාව්‍ය ලක්ෂණවලින් යුතු වීමත් , උපදේශ කාව්‍යවලින් නිරූපණය වේ . හානා හීය පානා අඩහැරෙන් දැනේ කවි පන්තිය ඇසුරින් නිදසුන් දෙමින් පැහැදිලි කරන්න .

(ලකුණු 15)

4)

I. මිනිස් සිත්වල පවත්නා සැඟවුණු ස්වභාවයන් අපූර්වාකාරයෙන් විවරණය කිරීම

II. ඒ ඒ චරිත කෙරෙහි අනුකම්පා සහගතව බැලීමට ධර්මසේන හිමියන් ගෙන ඇති උත්සාහය

"උග්ගසේන සිටු පුත්හුගේ වස්තුව" ඇසුරින් කරුණු දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

I. මාර්ග වර්ණනයේ දී ස්වභාවෝක්තියට මුල් තැන දෙන අයුරු

II. ස්වභාවික සෞන්දර්යය වර්ණනා සඳහා යොදා ගන්නා කාව්‍ය උපක්‍රමවල යෝග්‍යතාව " මගවිසිතුරු" පාඩමෙන් උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**5, 6, 7 ප්‍රශ්න වලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.**

5) ගුත්තිල වෙණ නද පැදි පෙළ රචනයේ දී කවියා අපූර්ව කාව්‍ය සංකල්පනා යොදා ගැනීම නිසා වීණා නාදයේ මිහිරි බව මැනවින් ප්‍රකට වේ. නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් වත් දක්වමින් විමසන්න.

(ලකුණු 10)

6) "අපටත් වැසිකිළියක්" කෙටි කතාවේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට එහි එන චරිත ඉවහල් වන ආකාරය නිදසුන් තුනක් වත් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

7) ජීවිතයේ යථාර්ථය " වස්සානය " පැදි පෙළෙන් අපූර්ව ලෙස නිරූපණය කෙරෙන ආකාරය නිදසුන් තුනක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

අ.පො.ස ( සා. පෙළ) අවසාන වාර පරීක්ෂණය -

**සිංහල භාෂාව හා සාහිත්‍යය.**

11 ශ්‍රේණිය

1 - පත්‍රය.

| | | | |
|---|---|---|---|
| 1 - 4 | 11 - 2 | 21 - 3 | 31 - 2 |
| 2 - 3 | 12 - 4 | 22 - 4 | 32 - 2 |
| 3 - 2 | 13 - 1 | 23 - 2 | 33 - 2 |
| 4 - 1 | 14 - 3 | 24 - 4 | 34 - 1 |
| 5 - 4 | 15 - 3 | 25 - 1 | 35 - 2 |
| 6 - 4 | 16 - 4 | 26 - 3 | 36 - 3 |
| 7 - 2 | 17 - 2 | 27 - 4 | 37 - 4 |
| 8 - 4 | 18 - 1 | 28 - 1 | 38 - 2 |
| 9 - 3 | 19 - 1 | 29 - 2 | 39 - 3 |
| 10 - 2 | 20 - 3 | 30 - 1 | 40 - 2 |